**සේරුවිල ප්‍රාදේශීය සභාව**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

## 01. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ඔක්තෝම්බර් 29 දින ද ඉකත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 24 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල විගණකාධිපතවරයාගේ වාර්තාව 2015 මාර්තු 24 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට සේරුවිල ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

2014 ජනවාරි 27 දිනැති අංක පීඑල්/05/බීඒ/ශ්‍රිලරාඅගිප්‍ර දරන පළාත් පාලන සහ පලාත් සභා අමාත්‍යාංශයේ චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සේවක ණය ලේඛනය අනුව 2013 දෙසැම්බර් 31 දිනට රු. 1,748,149 ක් වු සේවක ණය ශේෂය රු. 1,655,044 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබීමෙන් සේවක ණය රු. 93,105 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ආ) කඩ කාමර කලී ලේඛනය අනුව 2013 දෙසැම්බර් 31 දිනට රු. 382,921 ක් වු ලැබිය යුතු කඩ කාමර කුලී ශේෂය රු. 246,645 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබීමෙන් **ලැබිය යුතු** කඩ කාමර කුලී රු. 136,276 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

### 1.3.3 ලැබිය යුතු ගිණුම්

වර්ෂ 02 සිට වර්ෂ 03 ක් දක්වා වූ කාල පරිච්ඡේදයකට අදාල එකතුව රු. 246,646 ක් වූ ලැබිය යුතු කඩ කාමර කුලී අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

පහත සඳහන් ගිණුම් විෂයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිකම හේතුවෙන් එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම (රු) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| වර්ෂය තුල එකතු කළ ස්ථාවර වත්කම් | 71,517,158 | විස්තරාත්මක උපලේඛන, ස්ථාවර වත්කම් ලේඛනය සහ හිමිකම් ඔප්පු |
| ගෙවිය යුතු ගිණුම් | 9,341,439 | ශේෂ සනාථ ලිපි ,කාලවිශ්ලේෂණ වාර්තා , විස්තරාත්මක උපලේඛන |

### 1.3.5 නීති,රීති, රෙගුලාසිවලට අනුකුල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති,රීති , රෙගුලාසි සහ විධි විධානවලට අනුකුල නොවීම් පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකුල නොවීම |
|---|---|---|
| (අ) | 1989 අප්‍රේල් 17 දින අංක 554/ 5 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 59 වැනි රීතිය. | සභා බල ප්‍රදේශයට අයත් ව්‍යාපාර ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ආ) | පලාත් පාලන, පලාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කල යුතු වුවද, සභාව සතු වාහන 16 සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | පළාත් මූල්‍ය රීති අංක 236 | නිකුත් කල මාස 06 ඉක්මවා තිබූ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ රු. 19,176 ක් වටිනා චෙක්පත් 19 ක් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | මු.රෙ. 570 | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු රු. 117,966 ක ශේෂයක් වර්ෂ දෙකකට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබුණද නිරවුල් කිරීමට හෝ ආදායම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. |

**02. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

-----------------

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශයන්ට අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 10,081,004 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,553,654 ක් විය.

පසුගිය වර්ෂයට සාපේක්ෂව වරෙන්තු ගාස්තු හා දඩ ලැබීම් රු. 12,242,329 කින් වැඩි වීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 8,527,350 කින් වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2013 වර්ෂය | | |
|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | **රු.000** | **රු.000** | **රු.000** |
| වරිපනම් හා බදු | 30 | 13 | - |
| බදු කුලී | 2,205 | 1,898 | 247 |
| බලපත්‍ර ගාස්තු | 269 | 421 | - |
| වෙනත් ආදායම් | 15,796 | 12,824 | - |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

#### 3.1.1 ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය පවත්වා ගෙන යාම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරණු නිරීක්ෂණය කෙරේ.

(අ) ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ සංඛ්‍යා ලේඛණ අනුව 2013 වර්ෂයේ රෝගීන් 1,711 ක් සඳහා ද, 2014 වර්ෂයේ මුල් මාස 05 තුල රෝගීන් 1,186 ක් සඳහා ද ඖෂධ නිකුත් කර තිබුණි. ආයුර්වේද වෛද්‍යවරයෙකු නොමැති වීම හේතුවෙන් ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය 2014 ජුනි මස සිට වසා තිබීම හේතුවෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් 14,741 ක් වූ ජනතාවට සේවය සපයා ඔවුන්ගේ සෞඛ්‍ය මට්ටම නංවාලීමේ ප්‍රාදේශීය සභාවේ අරමුණු ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

**(ආ)** ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය වසා තිබීම හේතුවෙන වටිනාකම රු. 112,260 ක් වූ ආයුර්වේද ඖෂධ තොගයක් **සහ** සභා ආයුර්වේද මධ්‍යස්ථානයේ වෛද්‍ය **හා කාර්යාල** උපකරණ නිෂ්කාර්යව තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

### (අ) බඩු වට්ටෝරු පොත පවත්වා ගෙන යාම

විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 09 දින වන විටද බඩු වට්ටෝරු පොත යාවත්කාලීන කර නිසි ආකෘතියෙන් පවත්වා ගෙන නොතිබුණු අතර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල **සාමාජිකයන් විසින්** බඩු වට්ටෝරු පොත ශේෂ කර අත්සන් කර නොතිබුණි.

### (ආ) ප්‍රාදේශීය සභා ආකෘති (PS Form) පිළියෙල කිරීම

2013 වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසයන් සඳහා හිඟ ආදායම්,දෛනික ආදායම් වර්ගීකරණය, මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය, මාසික ඒකාබද්ධ ලැබීම් විශ්ලේෂණය, මාසික ඒකාබද්ධ වැය සාරාංශය, මාසික ඒකාබද්ධ වැය විශ්ලේෂණය යන ප්‍රාදේශීය සභා ආකෘති පිළියෙල කර නොතිබුණි.

### (ඇ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම.

2014 ජනවාරි 28 දින පැවැත් වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව භාණ්ඩ වර්ග 23 ක් අළුත්වැඩියා කිරීමටත් , භාණ්ඩ වර්ග 11 ක් ඉවත් කිරීමටත් , භාණ්ඩ වර්ග 14 ක් විනාශ කිරීමටත් නිර්දේශ කර තිබුණත් විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 09 දින වන විට ද ඒ සඳහා අවශ්‍යය කටයුතු ගෙන නොතිබුණි.

### (ඇ) කාර්යාල උපකරණ මිලදී ගැනීම

තාක්ෂණික ඇගයීම් කමිටුවක් මගින් සුදුසු සැපයුම්කරුවන් තෝරා ගැනීමේ විධිමත් පර්පාටියක් අනුගමනය නොකර 2014 වර්ෂයේ දී පුරනැගුම මූල්‍ය ප්‍රතිපාදන මගින් රු. 2,401,300 ක කාර්යාල උපකරණ මිල දී ගෙන තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

ප්‍රාදේශිය සභා කාර්යාලය සඳහා **ගොඩනැගිල්ලක් ඉදිකිරීම**

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය සභාවේ කාර්යාලය සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට රු. 27,709,341 (වැට් රහිත) වටිනාකමට මාස 06 ක කාලයක් තුල ඉදිකිරීම් අවසන් කිරීමේ පදනම මත 2012 දෙසැම්බර් 17 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

**(අ)** මෙම ගොඩනැගිල්ල 2014 මාර්තු මස 12 දින උත්සවාකාරයෙන් ජනතා අයිතියට පත්කර තිබුණත්, වැඩ සම්පූර්ණ කිරීමේ ඉංජිනේරු සහතිකයක් ලබා ගෙන සභාව විසින් ගොඩනැගිල්ල භාර ගැනීමට විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 09 දක්වා කටයුතු කර නොතිබුණි.

**(ආ)** ගොඩනැගිල්ලේ වහලයෙන් රැස්වීම් ශාලාවේ ඇති ෆයිබර් ( Fiber) සිවිලිමට මෙන්ම ලී වලින් තනා ඇති සිවිලිමට ජලය කාන්දු වී සිවිලිම දිරායාමට ලක් වී තිබුණි. සිවිලිමේ ස්ථාන 4 කින් ජලය විශාල වශයෙන් කාන්දු වන බව විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ අතර එය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ගොඩනැගිල්ලේ ඉංජිනේරු ඇස්තමේන්තුවල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව රැස්වීම් ශාලාවේ දොරවල් සහ ජනේල ඉදිකර නොමැති බව නියැදි විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ අතර, ඒවා ඇස්තමේන්තු පිරිවිතරයන්ට අනුව ඉදිකර ඇති බවට සහතික කරමින් රු. 1,842,680 ක් ගෙවා තිබුණි. විස්තර පහත දැක්වේ.

| ප්‍රමාණ පත්‍රය අනුව අයිතමයේ අංකය | ඉංජිනේරු පිරිවිතරයන්ට අනුව කාර්ය පිරිවිතරය | නිම කරන ලද කාර්යය | ගෙවන ලද මුදල |
|---|---|---|---|
| ------------ | -------------------- | ------------------------ | ------- |
| | | | රු. |
| එම්-2 | ඝන වීදුරු යෙදූ සුලං කපොල්ල සහිත ඇලුමිනියම් හා වීදුරු දොර | කවුලුවක් සහිත ඇළුමිනිය හා විදුරු දොර | 50,490 |
| එම් -8 එම්-11 | ඝන වීදුරු යෙදූ සුලං කපොල්ල සහිත ඇළුමිනියම් හා වීදුරු ජනෙල් | කවුලුවක් සහිත ඇලුමිනියම් හා විදුරු දොර | 1,349,000 |
| එම්-13 එම්-14 | ඝන වීදුරු යෙදූ සුලං කපොල්ල සහිත ඇලුමිනියම් ජනේල | කවුලුවක් සහිත ඇලුමිනියම් හා විදුරු ජනේල | 443,190 |
| | | | **1,842,680** |

**(ඈ)** ගොඩනැගිල්ලෙහි ඉදිකර තිබූ වීදුරු ජනේල 105 සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු ප්‍රකාරව Grill ආවරණය වෙනුවෙන් වර්ග මීටර් 140 කට රු. 630,000 ක් වෙන් කර තිබුණ ද , එම ආවරණ යොදා නොතිබූ අතර එය සභාවේ ආරක්ෂාවට ගැටළුවක් විය හැකි බව විගණනයේ දී නිරීක්ෂණය කෙරේ.

**(ඉ)** 2005 අංක 03 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර (2007 අංක 13 හා 2009 අංක 18 දරන මුදල් සංශෝධන පනත්වලින් කරනු ලබන සංශෝධනවලට යටත්ව) කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ රු. 30,065,945 ට අදාල කර්මාන්ත සහතික අරමුදල් බද්ද (CIGFL) වන රු. 75,165 ක් රඳවාගෙන දේශීය ආදායම් කොමසාරිස්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

## 04. මානව සම්පත් කළමනාකරණය

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක මට්ටම | 02 | 02 | - |
| ද්විතික මට්ටම | 19 | 05 | 14 |
| තෘතීය මට්ටම | 12 | 06 | 06 |
| **එකතුව** | 33 | 13 | 20 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 ජුනි මස සිට පුරප්පාඩුව පවතින ප්‍රාදේශීය සභාවේ ආයුර්වේද වෛද්‍ය තනතුර සඳහා සුදුසු පුද්ගලයකු පත් කිරීමට විගණිත දින වන විටද කටයුතු කර නොතිබුණි.

(ආ) පුස්තකාලයාධිපති, තාක්ෂණක නිලධාරී, විදුලි කාර්මික නිලධාරී , සංවර්ධන නිලධාරී , ආදායම් පරික්ෂක , රියදුරු , යන්ත්‍ර ක්‍රියාකරු සහ වැඩ පරික්ෂක තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට විගණිත දිනය වන විටද කටයුතු කර නොතිබුණි.

## 05. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) මානව සම්පත් කළමනාකරණය

(ඊ) අවයැය පාලනය